සැ.යු.- 2017.03.17 දින පළ වූ අංක 2011 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,012 - 2017 මාර්තු මස 24 වැනි සිකුරාදා - 2017.03.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 708 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 724 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු. -(i) බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත 2017 මාර්තු මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) (සංශෝධන) පනත් කෙටුම්පත 2017 මාර්තු මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 අප්‍රේල් මස 12 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 මාර්තු මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## දොම්පෙ ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට ස්ථිර පදනම මත බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු පවතින තනතුරු වර්ග හා ඒ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ :-

| *තනතුර* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය හා වැටුප් කේත අංකය* | *සුදුසුකම්* |
|---|---|---|---|
| 01. රියැදුරු III | 03 | රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 (PL 3 - 2016 ) (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 හි විධිවිධාන අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ.) | (1) *අධ්‍යාපන සුදුසුකම්* - අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (එක් වරක දී විෂයයන් 05 අවම වශයෙන් සමත්ව තිබිය යුතුය.)<br><br>(2) *වෘත්තීය සුදුසුකම්* - පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ සඳහා රියැදුරු බලපත්‍රයක් එනම්, ඒ 1 සහ සී1 පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව බී සහ ඩී 1 පන්තියේ බලපත්‍රයක් නැතහොත් තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් හෝ ඒ පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව ඩී පන්තියේ බලපත්‍රයක් තිබිය යුතුය.<br><br>(2.1) මහා මාර්ග නීතිරීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.<br><br>(3) *පළපුරුද්ද* - බලපත්‍ර ලැබීමෙන් පසු රියැදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)<br><br>(4) *කායික සුදුසුකම්* - අවම උස අඩි 05ක් විය යුතුය. දිවා කාලයේ හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදවීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කළ හැකිය. |

| තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය හා වැටුප් කේත අංකය | සුදුසුකම් |
|---|---|---|---|

(5) *වෙනත් සුදුසුකම්:*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනට අවම වශයෙන් වසර 03 ක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

(iv) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් හා වයස සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට, එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(6) වයස .— අවම වයස: අවු. 18 ට නොඅඩු
උපරිම වයස .— අවු. 45ට නොවැඩි
(දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

(7) *බඳවා ගැනීමේ ක්‍රමය .—* වෘත්තීය පරීක්ෂණයකින් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින්

(7.1) *වෘත්තීය සුදුසුකම් :*

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| 2. මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන විධායක/මාණ්ඩලික නිලධාරියකු, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකයෙකු, පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

(7.2) *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය -*
බඳවා ගැනීමේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පැවැත්වේ. ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

08. *තනතුරු සඳහා වෙනත් සුදුසුකම් :-*

1. අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
2. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්නව වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය ඇති තැනැත්තෙකු විය යුතුය.
3. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවකු හෝ රජයේ, පළාත් හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

09. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. අදාල පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.
3. බඳවා ගනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.
4. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත් විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාත්මක කරනු සඳහාත් දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධි විධානයන්ට එකඟව ක්‍රියාකළ යුතුය.

සැ.යු. - මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලට ද දෙපාර්තමේන්තු නියෝග වලටද, බස්නාහිර පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ දොම්පෙ ප්‍රාදේශීය සභාව විසින් වරින්වර පනවනු ලබන රෙගුලාසි හා නියෝග වලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

10. බඳවාගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය :

10.1 මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක (අංක 01 සිට 10 දක්වා එක පැත්තකද, අංක 11 සිට ඉදිරියට අනෙක් පැත්තද) වන සේ කඩදාසියේ දෙපැත්තේ අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

10.2 අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කොට 2017.04.07 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, දොම්පෙ ප්‍රාදේශීය සභාව, කිරිඳිවැල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතුය)

10.3 තැපෑලේදී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.4 අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලි වල සහතික පිටපත් එවිය යුතුය.
*(අ)* උප්පැන්න සහතිකය,
*(ආ)* ජාතික හැඳුනුම්පත,
*(ඇ)* අධ්‍යාපන සහතික හෝ ඉහළම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන වෙනත් සහතික,
*(ඈ)* ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත්කළ පදිංචිය පිළිබඳ සහතිකය,
*(ඉ)* මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක් (එකක් ග්‍රාම නිලධාරී මහතාගෙන් ලබාගත් චරිත සහතිකය),
*(ඊ)* සේවා සුදුසුකම් දක්වෙන සහතිකය,
*(උ)* වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික.

11. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල දොම්පෙ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

එම්. යූ. ආර්. මද්දුමගේ,
ලේකම්,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2017 මාර්තු මස 07 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

### ආදර්ශ අයදුම් පත්‍රය

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දොම්පෙ ප්‍රාදේශීය සභාවේ*
*......................................තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————————————.
02. මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————.
04. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :——————————————.
05. ස්ථිර ලිපිනය :——————————————.
06. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.
07. උපන් දිනය :- අවුරුද්ද :————. මාසය :-————. දිනය :————.
08. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————.
09. විවාහක/අවිවාහක භාවය :——————————————.
10. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස :අවුරුදු :-————. මාස :-————. දින :————.
11. බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි කාලය :——————————————.
12. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචියෙන්ද යන වග :——————————————.
13. අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය) :
    (අ) සමත් වූ වසර :———— ශ්‍රේණිය :————
    (ආ) විභාග අංකය :———— වර්ෂය :————

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ඇ) අ.පො.ස. (උ.පෙළ) විභාගය (සහතික පිටපත් ඇමිණිය යුතුය.)
විභාග අංකය :———— වර්ෂය :————

| *විෂය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

14. වෘත්තීය සුදුසුකම් :——————————————.
15. සේවා පළපුරුද්ද :——————————————.
16. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? තිබේනම් ඒ පිළිබඳ විස්තර :————————.

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු සපයා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දන්වමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

03-993

## පාලින්දනුවර ප්‍රාදේශීය සභාව

### තනතුරු පුරප්පාඩු

පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීම - මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති පාලින්දනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් - අභ්‍යන්තර | අධ්‍යාපන සුදුසුකම් - බාහිර | වෙනත් | වැටුප් පරිමාණය |
|---|---|---|---|---|---|---|
| 01 | වැඩ ක්ෂේත්‍ර පරිපාලක iii | 01 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාව සහ ගණිතය ඇතුළුව යටත් පිරිසෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම. (මින් විෂයයන් පහක් (05) එකවර සමත් වී තිබිය යුතු ය). | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම. සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | (අභ්‍යන්තර අයදුම් කරුවන්) පළපුරුද්ද ඃ<br>අදාළ පළාත් පාලන ආයතනයේ PL-1 හා PL-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා වසර (05) සපුරා ඇති සේවකයින් විය යුතු අතර, මෙම කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතු ය. (බාහිර අයදුම් කරුවන්ට) පළපුරුද්ද අදාළ නැත. | (MN-1-2016A රු 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540<br>1 වන කාර්යක්ෂමතා කඩඉම iii ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර (ලිඛිත පරීක්ෂණය) |

*බඳවා ගැනීම ඃ*

සියලුම අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට භාජනය විය යුතු අතර එම පරීක්ෂණයේ දී ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පුරවනු ලැබේ.

*විවෘත බඳවා ගැනීම ඃ*

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අභියෝගතාවය හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 100 | 40% |

*සීමිත බඳවා ගැනීම ඃ*

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| ක්ෂේත්‍රයට අදළ දැනුම පරීක්ෂා කිරීම | 100 | 40% |

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි ඃ*

(i) ශ්‍රී ලාංකිකයකු විය යුතු ය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 30ට නොවැඩි විය යුතු ය. දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(iii) බස්නාහිර පළාත තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03ක ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතු ය.
(iv) පාලින්දනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතු ය.
(v) යහපත් චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
(vi) දණ්ඩ නීති සංග්‍රහයේ යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
(vii) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු නොලැබූ අයෙකු විය යුතු ය.
(viii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතු ය.
(ix) පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ දැනට අනියම්, ආදේශක, ව්‍යාපෘති, කොන්ත්‍රාත් (වැඩ ඒකක) සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.
(x) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර, කාලසීමාවේ දී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවා ගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි ‡*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ස්ථිර සේවකයින් අවුරුදු 01 ක වැඩ බැලීමේ කාලයකට යටත් වේ.
(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයකට දායක විය යුතු ය.
(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකග විය යුතු ය.
(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද බස්නාහිර පළාත් සභාව හෝ පාලින්දනුවර ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

04. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, පහත සඳහන් ලියකියවිලිවලට ඡායා පිටපත් අමුණා තිබිය යුතු ය ‡

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතිකය,
(iii) ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත,
(iv) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
(v) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (මින් 1 ක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතු ය.),
(vi) පළපුරුද්ද පිළිබඳ සහතිකය,
(vii) වෙනත් සුදුසුකම් පිළිබඳ සහතිකය.

05. *අයදුම් කළයුතු ආකාරය ‡*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12"x 8" ප්‍රමාණයේ අයදුම්පත් සකස්කර, ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ලියා අංක 4 ඡේදයේ දක්වා ඇති ලියකියවිලි ද සමගින් 2017.03.30 වැනි දින හෝ එදිනට පෙර "ලේකම්, පාලින්දනුවර ප්‍රාදේශීය සභාව, පාලින්දනුවර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ලලනි දිපිකා උඩුමුල්ල,
ලේකම්,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාව.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***පාලින්දනුවර ප්‍රාදේශීය සභාව***

.............................................................................. *තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. (i) මුලකුරු සමග නම :——————————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
02. ස්ථිර ලිපිනය :——————————.
03. උපන් දිනය :——————————.
04. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
05. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |
06. දුරකථන අංකය :——————————.

07. විවාහක/අවිවාහක බව :——————————————.

08. අධ්‍යාපන සුදුසුකම් :——————————————.

8.1 අයදුම්කරුවන් අවසන් වරට සමත් වූ විභාගය :——————————————.

8.2 අ.පො.ස. (සා/පෙළ) විභාගය :

(i) වර්ෂය :——————. මාසය :——————.

(ii) විභාග අංකය :——————.

(iii) ප්‍රතිඵල :——————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

8.3 අ.පො.ස. (උ/පෙළ) විභාගය :

(i) වර්ෂය :—————— මාසය :——————

(ii) විභාග අංකය :——————

(iii) ප්‍රතිඵල :———

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

09. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————————————.

10. වෙනත් සුදුසුකම් :——————————————.

11. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද?/නැතිද? යන වග :——————————.

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමටද යටත් වන බවද මම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

03-1059

**අගලවත්ත ප්‍රාදේශීය සභාව**

තනතුරු පුරප්පාඩු

අගලවත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීම - මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අගලවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් - අභ්‍යන්තර | අධ්‍යාපන සුදුසුකම් - බාහිර | වෙනත් | වැටුප් පරිමාණය |
|---|---|---|---|---|---|---|
| 01 | වැඩ ක්ෂේත්‍ර පරිපාලක iii | 01 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාව සහ ගණිතය ඇතුළුව යටත් පිරිසෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම. (මින් විෂයයන් පහක් (05) එකවර සමත් වී තිබිය යුතු ය). | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම. සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | (අභ්‍යන්තර අයදුම් කරුවන්) පළපුරුද්ද : අදාළ පළාත් පාලන ආයතනයේ PL-1 හා PL-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා වසර (05) සපුරා ඇති සේවකයින් විය යුතු අතර මෙම කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතු ය. (බාහිර අයදුම් කරුවන්ට) පළපුරුද්ද අදාළ නැත. | (MN-1-2016A රු 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540 1 වන කාර්යක්ෂමතා කඩඉම iii ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර (ලිඛිත පරීක්ෂණය) |

*බඳවා ගැනීම :*

සියලුම අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට භාජනය විය යුතු අතර එම පරීක්ෂණයේ දී ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පුරවනු ලැබේ.

*විවෘත බඳවා ගැනීම :*

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අභියෝගතාවය හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 100 | 40% |

*සීමිත බඳවා ගැනීම :*

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම | 100 | 40% |

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

(i) ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 30ට නොවැඩි විය යුතු ය. දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(iii) බස්නාහිර පළාත තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03ක ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතු ය.

(iv) අගලවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතු ය.
(v) යහපත් චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
(vii) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු නොලැබූ අයෙකු විය යුතු ය.
(viii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතු ය.
(ix) අගලවත්ත ප්‍රාදේශීය සභාවේ දැනට අනියම්, ආදේශක, ව්‍යාපෘති, කොන්ත්‍රාත් (වැඩ ඒකක) සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.
(x) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදළ නව බඳවා ගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම අගලවත්ත ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ස්ථිර සේවකයින් අවුරුදු 1ක වැඩ බැලීමේ කාලයකට යටත් වේ.
(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක විය යුතු ය.
(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතු ය.
(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද බස්නාහිර පළාත් සභාව හෝ අගලවත්ත ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

04. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා තිබිය යුතු ය :

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතිකය,
(iii) ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත,
(iv) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
(v) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (මින් 1ක් ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් එකක් විය යුතු ය.),
(vi) පළපුරුද්ද පිළිබඳ සහතිකය,
(vii) වෙනත් සුදුසුකම් පිළිබඳ සහතිකය.

05. *අයදුම්කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12"x 8" ප්‍රමාණයේ අයදුම්පත් සකස්කර, ඉල්ලුම් කරන තනතුර අදළ කවරයේ වම්පස ලියා ඇති අංක 4 ඡේදයේ දක්වා ඇති ලියකියවිලි ද සමගින් 2017.03.30 වැනි දින හෝ එදිනට පෙර ලේකම්, අගලවත්ත ප්‍රාදේශීය සභාව, අගලවත්ත යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ලලනි දීපිකා උඩුමුල්ල,
ලේකම්,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

***ආදර්ශ අයදුම් පත්‍රය***

***අගලවත්ත ප්‍රාදේශීය සභාව***

*අගලවත්ත ප්‍රාදේශීය සභාවේ ........................................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ නම මුලකුරු සමග :——————————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————.
3. ස්ථිර ලිපිනය :——————————————.
4. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :——————————————.
5. දිස්ත්‍රික්කය :——————————————.
6. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.
7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට (2017.03.30) වයස : අවුරුදු :————. මාස :————. දින :————.

8. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————.

9. විවාහක ද/අවිවාහක ද යන වග :——————————————.

10. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————

11. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.

12. දුරකථන අංකය :——————————————.

13. අධ්‍යාපන සුදුසුකම් :——————————————.

අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත් වර්ෂය හ විභාග අංකය :

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

14. අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වර්ෂය හා විභාග අංකය :

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

15. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ආදේශක/අනියම් ලෙස සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර :

එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම මත ද යන වග)

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවද දනිමි.

දිනය : ................................................ ......................................................................,

අයදුම්කරුගේ අත්සන,

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

......................................................................මහතා/මහත්මිය මෙම ආයතනයේ ..........................................වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

......................................................................,

ආයතන ප්‍රධානියාගේ අත්සන.

03-1147

## නාගොඩ ප්‍රාදේශීය සභාව

නාගොඩ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *සේවා ගණය හා ශ්‍රේණිය* | *මාසික වැටුප් පරිමාණය හා වැටුප් කේත අංකය* | *බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 04 | ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය | රු 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410<br>PL 1 - 2016<br>(මූලික වැටුප රු. 24,250.00 අදාළ වන්නේ 2020.01.01 වැනි දින සිට ය.<br>බඳවා ගැනීමේ මූලික වැටුප් පියවර 2017 - රු. 14,234.00 සහ ගැලපුම් දීමනාව රු. 10,006.00 වේ. | 8 වන ශ්‍රේණිය (09 වසර) සමත් වී තිබීම |
| 02 | කාර්යාල කාර්ය සහායක | 01 | ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය | රු 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410<br>PL 1 - 2016<br>(මූලික වැටුප රු. 24,250 අදළ වන්නේ 2020.01.01 වැනි දින සිට ය.<br>බඳවා ගැනීමේ මූලික වැටුප් පියවර 2017 - රු. 14,234.00 සහ ගැලපුම් දීමනාව රු. 10,006.00 වේ. | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙන් සම්මාන 02ක් සහිතව විෂයන් හය (06) ක් සමත් වී තිබිය යුතු ය. |

01. *බඳවා ගැනීම සඳහා වන පොදු සුදුසුකම් හා කොන්දේසි* :-

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක්, දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩිවිය යුතුය. (දැනටමත් රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
4. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ට විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ
5. අයදුම්කරුවන් යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
6. මෙම අයඳුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම ආදී බලතල නාගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.
7. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
8. ඉහත තනුරුවලට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතු ය.
9. අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කරනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී ලැබූ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ඉහත තනතුරුවලට බඳවා ගනු ලැබේ.
10. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 2 | අමතර සුදුසුකම් (උපලේඛන - 2ට අනුව අදාළ නම්) | 10 | |
| 3 | පළපුරුද්ද (උපලේඛන - 2ට අනුව අදාළ නම්) | 10 | |
| 4 | සභා බල ප්‍රදේශයේ පදිංචිය (එක් වසරකට ලකුණු 5 බැගින්) | 45 | |
| 5 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

02. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිර ය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට නිලධාරින් යටත් විය යුතු වේ.
2. තෝරාගනු ලබන්නේ අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ව ය. පරිවාස කාලය අවසානයේ වැඩ, පැමිණීම, හැසිරීම, සතුටුදායක නම් තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.
3. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ රෙගුලාසිවලටද, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ නියෝගවලට ද, දකුණු පළාත් සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

03. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

01. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදසියක අයදුම්පත පිළියෙළ කර, ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව ගා/නාගොඩ යන ලිපිනයට 2017.04.07 වැනි දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
(දැනටමත් රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුය. නියමිත දිනයට පසුව ලැබෙන ඉල්ලුම්පත් නොසලකා හරිනු ලැබේ. සහතිවල පිටපත් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් සහ අවශ්‍ය සහතික නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු ය.)

02. අයදුම්පත සමග පහත සඳහන් ලියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය. මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

    01. උප්පැන්න සහතිකය,
    02. අධ්‍යාපන සහතිකය,
    03. අදළ කාල සීමාව සඳහා පදිංචිය සනාථ කිරීම පිණිස පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදළ ප්‍රාදේශීය ලේකම් විසින් අනුඅත්සන් තබන ලද ග්‍රාම නිලධාරි සහතිකය,
    04. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්,
    05. වෙනත් සුදුසුකම් තිබේ නම් එය සනාථ කිරීමට සහතික.

03. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

    01. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
    02. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

එම්. එච්. ෆර්සියා ෆර්වින්,
ලේකම්,
නාගොඩ ප්‍රාදේශීය සභාව,
නාගොඩ.

2017 මාර්තු මස 08 වැනි දින,
නාගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

*.......................................................................... තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම් පත්‍රය*

1. (අ) මුලකුරු සමග නම :——————————————.
   (ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————.
2. ස්ථිර පදිංචි දිසත්‍රික්කය :——————————————.
3. ස්ථිර පදිංචි ලිපිනය :——————————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.
5. ස්ත්‍රී පුරුෂ භාවය :——————————————.
6. උපන් දිනය :- වර්ෂය :—————. මාසය :—————. දිනය :—————.
7.. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවු. :—————. මාස :—————. දින :—————.
8. විවාහක/අවිවාහක බව :——————————————.
9. ජාතිය :——————————————.
10. දුරකථන අංකය :——————————————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? :——————————————.
    එසේ නම්, එය පරම්පරාවෙන් ද, ලියාපදිංචියෙන් ද? :——————————————.

12. අධ්‍යාපන සුදුසුකම් :——————————————.
    විභාග අංකය :——————————————.

I පළමුවර ප්‍රතිඵල වර්ෂය : ................................... මාසය : ....................................

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

II දෙවනවර ප්‍රතිඵල වර්ෂය : ................................... මාසය : ....................................

විභාග අංකය :——————————————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

13. වෙනත් සුදුසුකම් :——————————————.

මවිසින් සපයා ඇති ඉහත සඳහන් තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු සපයා ඇති බව ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසුව සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මම දනිමි.

දිනය : ................................................ ....................................................................,

අයදුම්කරුගේ අත්සන.

**රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ දැනටමත් සේවයේ නියතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්කරු වන ....................................මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .......................වශයෙන් සේවය කරයි. අදාළ තනතුරට ඔහු/ඇය තේරී පත්වුවහොත් ඔහු/ඇය නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මෙයින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි.

දිනය : ................................................ .....................................................................,

අත්සන.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා.

නිල මුද්‍රාව :——————————————.
ආයතනය :——————————————.
නම :——————————————.
නිලය :——————————————.
දිනය :——————————————.

03 - 1146

---

## මිනුවන්ගොඩ නගර සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මිනුවන්ගොඩ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**උපලේඛනය**

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු (කා.සේ.සේ. III) | 01 | PL 1 - 2016 (රා.ප.ච. 03/2016ට අනුව) | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 300 x 100 - 330 x 12 - රු. 36,410 නමුත් රා.ප.ච.ලේ. 03/2016 අනුව මූලික වැටුප රු. 14,234 ක් හා ඊට අදළ ගැලපුම් දීමනාව ගෙවනු ඇත. (බඳවා ගෙන වසර 03ක් ගත වීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.) | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වැනි වසර සමත් වී තිබිය යුතු ය. |
| 02 | මුරකරු (කා.සේ.සේ. III) | 01 | PL 1 - 2016 (රා.ප.ච. 03/2016ට අනුව) | රු 24,250 - 10 x 250 - 10 x 270 - 300 x 10 - 330 x 12 - රු. 36,410 නමුත් රා.ප.ච.ලේ. 03/2016 අනුව මූලික වැටුප රු. 14,234ක් හා ඊට අදළ ගැලපුම් දීමනාව ගෙවනු ඇත. (බඳවා ගෙන වසර 03ක් ගත වීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.) | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සම්මාන 02ක් සහිතව විෂයන් හය (06)ක් සමත් වී තිබිය යුතුය. (මින් විෂයන් පහ (05)ක් එකවර සමත් වීය යුතු ය.) |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 03 | ආදහනාගාර ක්‍රියාකරු III කා.සේ.සේ. (අර්ධ ශිල්පීය) | 01 | PL 2-2016 (රා.ප.ච. 03/2016ට අනුව) | රු 25,250 - 10 x 270 - 10 x 300 - 330 x 10 - 350 x 12 - රු. 38,450<br>නමුත් රා.ප.ච.ලේ. 03/2016 අනුව මූලික වැටුප රු. 14,818 ක් හා ඊට අදළ ගැලපුම් දීමනාව ගෙවනු ඇත.<br>(බඳවා ගෙන වසර 03ක් ගත වීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.) | *අධ්‍යාපන සුදුසුකම් :*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සම්මාන 02ක් සහිතව විෂයන් හය (06) ක් සමත් වී තිබිම.<br>(මින් විෂයන් පහ (05)ක් එකවර සමත් විය යුතු ය.)<br>*වෘත්තීය සුදුසුකම් :*<br>අදළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හී (N.V.Q.) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම හා අවම වශයෙන් අදළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.<br>(සහතිකය මගින් සනාථ කළ යුතු ය.) |

02. *පොදු සුදුසුකම් :*

1. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය,
2. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය,
3. අයදුම්පත් කැඳවන දිනට පෙරාතුව බස්නාහිර පළාතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අවම වශයෙන් වසර 03ක ස්ථිර පදිංචියක් තිබිය යුතු ය,
4. අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා උපරිම වයස බලපානු නොලැබේ,
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.

03. *බඳවා ගැනීම හා සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය,
2. නියම කරනු ලබන ප්‍රතිශතයකින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය,
3. බඳවා ගනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ,
4. සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වන අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා වාචික පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගැනීම කරනු ලැබේ.

04. *සේවා කොන්දේසි :*

පත්වීම ලබන්නන් ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලට ද, බස්නාහිර පළාත් රෙගුලාසි හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ මිනුවන්ගොඩ නගර සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

05. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විසින් සකස් කර එවනු ලබන අයදුම්පත් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව 2017.04.17 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම් හා සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි, මිනුවන්ගොඩ නගර සභාව, මිනුවන්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. තව ද අයදුම් පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු ය. ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධව සලකා බලනු නොලැබේ.

අයදුම්පත්‍රය සමග සුදුසුකම් සනාථ කිරීම සඳහා අදළ පහත සඳහන් සහතික පිටපත් අමුණා එවිය යුතු ය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතිකය,
3. ග්‍රාම නිලධාරි සහතිකය,
4. පළපුරුද්ද පිළිබඳ සහතික,
5. චරිත සහතික දෙකක්.

මෙම අයදුම්පත්‍ර කැඳවීමේදී හෝ කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම හෝ බඳවා නොගැනීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සියලු බලතල මිනුවන්ගොඩ නගර සභාවේ ලේකම් සතුවේ.

එච්. ඒ. එස්. රත්නලතා,
ලේකම් හා සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මිනුවන්ගොඩ නගර සභාව,
මිනුවන්ගොඩ.

2017 මාර්තු මස 10 වැනි දින,
මිනුවන්ගොඩ නගර සභාවේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මිනුවන්ගොඩ නගර සභාවේ .....................................තනතුරු සඳහා ආදර්ශ අයදුම්පත්‍රය***

1. I. මුලකුරු සමග නම :——————————————.
   II. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————.
3. ස්ථිර පදිංචි ලිපිනය :——————————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————.
6. උපන් දිනය :- අවුරුද්ද :—————. මාසය :—————. දිනය :—————.
7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :——————————————.
8. විවාහක/අවිවාහක බව :——————————————.
9. ශ්‍රී ලංකා පුරවැසියෙක් වන්නේ උපතින් ද? ලියාපදිංචිවීමෙන් ද? :——————————————.
10. 1. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය): ——————————————.
——————————————.
——————————————.
——————————————.
——————————————.
——————————————.
   II. වෙනත් සුදුසුකම් :——————————————.
   III. වෘත්තීය සුදුසුකම් :——————————————.
   II. සේවා පළපුරුද්ද :——————————————.

11. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර :

ස්ථිර/අනියම්/තාවකාලක/කොන්ත්‍රාත/ආදේශක ද යන වග :————————————.

එම තනතුරට පත්වූ දිනය :

12. ඔබ කවරදක හෝ උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද? :————————————.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

දිනය : ............................................... ....................................................................,

අයදුම්කරුගේ අත්සන,

03 - 1148

---

# පළාත් පාලන නිවේදන

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

ගෝසාතක ආඥාපනත (271 වැනි අධිකාරිය)

මෙහි පහත දක්වෙන විස්තර සඳහන් ස්ථානයේ ගවමස් වෙළඳම් කිරීමට ඉල්ලුම්පතක් ලැබී ඇත. ගවමස් වෙළඳාම් කිරීම සඳහා 2017 වර්ෂයට බලපත්‍රයක් ලබාදෙන ලෙසට ඉල්ලීමක් කර ඇති බවට ගෝසාතක ආඥාපනත 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම බලපත්‍රය ලබා දීමට යම් විරෝධතාවයන් පවතී නම් උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි ඕනෑම අයෙකුට විරෝධතා ඉදිරිපත් කළ හැකි ය. එම විරෝධතාවලට හේතු සහිතව පිටපත් 2 කින් යුක්ත ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් (දින දහතරක්) ඇතුළත මවෙත ඉදිරිපත් කරන ලෙසට මෙයින් කාරුණිකව දන්වමි.

| *නම හා ලිපිනය* | *වෙළඳ ස්ථානයේ ලිපිනය* | *වෙළඳාම් කරන මස් වර්ගය* |
|---|---|---|
| ඒ. ආර්. එම්. නවාස් මයා | අංක 62/බී, දස්කර, මුරුතගහමුල | ගවමස් |

ජී. යූ. ගුණසිංහ,
ලේකම්,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

2017 පෙබරවාරි මස 06 වැනි දින, ගෙලිඔය,
උඩුනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-1061

**පානදුර ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව පහත උපලේඛනයේ විස්තර කර ඇති පාර පානදුර ප්‍රාදේශීය සභාවට පවරා ගෙන නඩත්තු කිරීමට 2016.10.12 වැනි දින පවත්වන ලද පානදුර ප්‍රාදේශීය සභා තීරණ කමිටුවෙහි දී මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

යථෝක්ත පවරා ගැනීම සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත් කරන්නේ නම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) උපවගන්තියේ විධිවිධාන පරිදි මෙම නිවේදනයේ සඳහන් දින සිට මාස 03 ක කාලයක් ඇතුළත මා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු බව ද දන්වමි.

ලේකම්,
පානදුර ප්‍රාදේශීය සභාව.
වාද්දූව.

2017 මාර්තු මස 08 වැනි දින,
පානදුර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

උපලේඛනය

| *ග්‍රාම සේවා කොට්ඨාසය* | *මාර්ගයේ නම* | *ආරම්භ වන ස්ථානය* | *අවසාන වන ස්ථානය* | *මාර්ගයේ දිග (මීටර්)* | *මාර්ගයේ පළල (මීටර්)* |
|---|---|---|---|---|---|
| 697 උතුරු තල්පිටිය | ගාළු පාරේ වරිපනම් අංක 274 පුද්ගලික නිවස හා වරිපනම් අංක 276 ව්‍යාපාරික ස්ථානය අතරින් ආරම්භ වන මාර්ගය | ගාලු පාර | ජී. ඩී. ගුණදස පෙරේරා මහතාගේ නිවස (වරිපනම් අංක 19/13) | 64.02 | 3.05 |

03-1114

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.